C
373

# මධ්‍ය මහා විද්‍යාලවල අපේක්ෂිත කාර්ය භාරය සහ මූල්‍ය සම්පාදනය පිළිබඳ ඇගයීමක්

(මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය ආශ්‍රයෙන්)

ගොඩ්වින් කොඩිතුවක්කු

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ශාස්ත්‍රපති උපාධිය
සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය

-1989-

422293

UNIVERSITY OF PERADENIYA
5-4-1990
LIBRARY

## සාර සංග්‍රහය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙන් ම ආර්ථික, සමාජ, සංස්කෘතික ව්‍යුහයේ ද වෙනස්කම් ඇති කිරීමට උපකාරී වූ එ සේ ම එ මඟින් රටට සැලකිය යුතු මෙහෙයක් සිදු කළ 1940 දශකයේ දි පිහිටුවන ලද මධ්‍ය පාසල් පිළිබඳ ව පර්යේෂණ ඇස ප්‍රමාණවත් පරිදි යොමු නොවී තිබීම මෙ ම පර්යේෂණය සඳහා මධ්‍ය පාසල් සමුච්චය තෝරා ගැනීමට මල පෑ ප්‍රධාන හේතුව වූයේ ය. මධ්‍ය පාසල් පිහිටුවීමෙන් අපේක්ෂා කළේ කුමන කාර්ය භාරයක් ඉටු කර ගැනීමට ද? එ ම කාර්ය භාරය වර්තමානයේ දි වෙනස් වී ඇත්තේ කෙසේ ද? මධ්‍ය මහා විද්‍යාලවල වර්තමාන කාර්ය භාරය ඉටු කර ගැනීමට මූලපමය සාධක බලපාන්නේ කෙසේ ද? යන ප්‍රශ්න පිළිබඳ ව විස්තරාත්මක විධි ක්‍රමය අනුව විමසා බැලීම මෙ ම පර්යේෂණයේ අභිප්‍රාය වූයේ ය.

නිබන්ධනයේ පළමු පරිච්ඡේදය පර්යේෂණය සඳහා භාවිත කළ ක්‍රම ශිල්පය විස්තර කිරීමට උපයෝගි කර ගන්නා ලදි.

දෙ වැනි පරිච්ඡේදයේ දි 1940 - 1947 කාලය තුළ දි මධ්‍ය පාසල් පිහිටුවීමට තුඩු දුන් හේතු විමසා බලන ලදි. මධ්‍ය පාසල් පිහිටුවීම අධ්‍යාපනය ප්‍රායෝගික අංශයට නැඹුරු කිරීමට ගත් ප්‍රයත්නාවලියක වැදගත් ඉදිරි පියවරක් බව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ඇසුරු කර ගෙන නිගමනය කරන ලදි. තත්කාලීන සමාජයේ සුදු කරපටි රැකියා සඳහා තිබූ ඉල්ලුමත්, එ ම ඉල්ලුම සපුරාලීමට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලැබූ ද්විතීයික අධ්‍යාපනය අවශ්‍ය වීමත් හේතු කොට ගෙන ද්විතීයක අධ්‍යාපනය ඉංග්‍රීසියෙන් නොමිලයේ ලබා ගැනීමට ජනතා ව තුළ තිබූ අපේක්ෂාව මධ්‍ය පාසල්වල අරමුණු සහ කාර්යභාරය 1940 දශකය තුළ දි ම වෙනස්වීමට උපස්ථම්භක වූ බව ද දෙ වැනි පරිච්ඡේදයේ දි තහවුරු කරන ලදි.

විශේෂ අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීම, ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන පෝෂිත පාසල් ලෙස කටයුතු කිරීම, නිදහස් අධ්‍යාපන අවස්ථා සුලභ කිරීම, නේවාසික පහසුකම් සහිත ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද්විතීයික අධ්‍යාපනය ලබා දීම සහ අංග සම්පූර්ණ මධ්‍ය පාඨශාලා ගම්බද පිහිටුවීම යන අරමුණු සහ භූමිකා මධ්‍ය පාසල්වලින් 1940 දශකය තුළ දි අපේක්ෂා කළ බව ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරු කර ගෙන තහවුරු කිරීමට තෙ වැනි පරිච්ඡේදයේ දි හැකි විය. එ ම අරමුණු හා කාර්ය භාරය පාදක කර ගෙන 1980 දශකය තෙක් මධ්‍ය පාසල් විකාශනය වූ ආකාරය විශ්ලේෂණය කිරීම ද එ ම පරිච්ඡේදයේ දි ම සිදු විය.

1980 දශකයේ මුල් භාගයේ දී මධ්‍ය මහා විද්‍යාලවල අරමුණු හා ඒවා ඉටු කළ කාර්ය භාරය හඳුනා ගැනීම පර්යේෂණයේ සිව් වැනි පරිච්ඡේදයේ දී සිදු විය. මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ 1940 - 1943 කාලය තුළ දී පිහිටුවන ලද මධ්‍ය පාසල් හතර පිළිබඳ ව කළ ප්‍රත්‍යෙක අධ්‍යයනය මගින් එ ම හඳුනා ගැනීම කරන ලදී. උචිත තත්හි දී මහනුවර දිස්ත්‍රික්කයේ වෙනත් පාසල්වල වෙසෙසින් 1 ඒ වර්ගයේ හා නාගරික ජනප්‍රිය පාසල්වල දත්ත, මධ්‍ය මහා විද්‍යාලවලින් ලත් දත්ත සමඟ සංසන්දනය කිරීම සඳහා භාවිත කරන ලදී. රැස් කර ගත් දත්ත අනුසාරයෙන් කළ ගුණාත්මක විශ්ලේෂණය අනුව වෙනත් පාසල්වලට සුවිශේෂී ව වෙනස් වූ අධ්‍යාපන ක්‍රමයක් මධ්‍ය මහා විද්‍යාලවල වර්තමානයේ දී නොපවතින බව පැහැදිලි විය. එ හෙත් විෂය මාලාව සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සැලකූ විට අනිකුත් පාසල්වලට වඩා මධ්‍ය මහා විද්‍යාලයක කාර්ය භාරය පුළුල් වේ. ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන් මධ්‍ය මහා විද්‍යාලවල නිදහස් අධ්‍යාපන අවස්ථාවලින් වර්තමානයේ දී නිසි ප්‍රයෝජන නොගන්නා අතර නාගරික ජනප්‍රිය පාසල් වෙත ඇති ආකර්ෂණය ප්‍රධාන වශයෙන් ඊට බල පා තිබේ. එ ම හේතුව ප්‍රධාන කොට ගෙන ම 1940 දශකයේ දී අපේක්ෂිත ආකාරයේ පෝෂිත පාසල් පද්ධතියක් වර්තමාන මධ්‍ය මහා විද්‍යාල තුළින් විද්‍යමාන නොවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය මහා විද්‍යාලවල නේවාසිකාගාර ශිෂ්‍යත්වධාරීන්ගෙන් පෝෂණය කිරීමේ අරමුණ ද වර්තමානයේ ඉටු නො වේ. මධ්‍ය මහා විද්‍යාල සාපේක්ෂ ව ගම්බද පිහිටි අංග සම්පූර්ණ පාඨශාලා ලෙස වර්තමානයේ දී ද සැලකිය හැකි ය. එ හෙත් ඒවා නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සැලසුම්ගත ආකාරයකට ක්‍රමවත් ව සිදු නො කෙරේ.

පස් වැනි පරිච්ඡේදයේ දී මධ්‍ය මහා විද්‍යාලවල වර්තමාන කාර්ය භාරය ඉටු කර ගැනීමට මූල්‍යමය සාධකය බලපාන ආකාරය විමසන ලදී. මධ්‍ය පාසල් පිහිටුවන ලද මුල් අවදියේ සිට ඒවායේ පැවැත්මට හා ක්‍රියාකාරීත්වයට මූල්‍යමය සාධකය බල පා තිබේ. වර්තමාන මධ්‍ය මහා විද්‍යාලවල කාර්ය භාරය ඉටු කර ගැනීමට ලැබෙන මූල්‍යමය ප්‍රතිපාදන රාජ්‍ය අංශයෙන් හා රාජ්‍ය නොවන අංශයෙන් ලැබෙන ප්‍රතිපාදන ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැකි ය. ඒවායින් රාජ්‍ය අංශයට අයත් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන සේවා අමාත්‍යාංශය සහ විමධ්‍යගත අයවැය යන මූලාශ්‍රවලින් ලැබෙන මුදල් මධ්‍ය මහා විද්‍යාලවල එදිනෙදා පැවැත්මට ද ප්‍රමාණවත් නො වේ. එ ම නිසා විදේශ ආයතන මධ්‍ය මහා විද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්, එ ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන් සහ මධ්‍ය මහා විද්‍යාලවල ආදි ශිෂ්‍යයන් යන රාජ්‍ය නොවන අංශවලට අයත් මූලාශ්‍රවලින්

ලබන මූල්‍ය ප්‍රතිපාදන මත වඩ වඩාත් යැපීමට සිදු වී තිබේ. මධ්‍ය මහා විද්‍යාලවලට අවශ්‍ය ප්‍රමාණයට විශාල මුදලක් නො ලැබුණත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් අය කරන පහසුකම් හා සේවා ගාස්තු ද ඔවුන්ගේ දෙමාපියන් සහ පාසල් ප්‍රජාව සිටින පාසල් සංවර්ධන සමිති ද රාජ්‍ය නොවන අංශයෙන් මධ්‍ය මහා විද්‍යාලවලට මුදල් ලැබෙන ප්‍රධාන මාර්ග දෙක ය. විෂය බාහිර ක්‍රියාකාරකම් ඉටු කිරීම මගින් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් එ සේ එකතු කරන මුදල් භාවිත කළ යුතු වුවත් පාසලේ එදිනෙදා පැවැත්මට එ ම මුදල් ප්‍රධාන වශයෙන් වැය කිරීමට සිදු වී ඇත්තේ ඒ සඳහා රාජ්‍ය අංශයෙන් ලැබෙන මුදල් ප්‍රමාණවත් නො වන නිසා ය.

මේ නිසා රාජ්‍ය ප්‍රාග්ධනය වැය කර නිදහස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් විශේෂ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ගම්බද පිහිටුවන ලද මිශ්‍ර අධ්‍යාපනයක් ලබා දුන් මධ්‍ය ද්විතීයික පාඨශාලාවල වර්තමාන පැවැත්මට සහ සංවර්ධනයටත් ඒවාට හිමි කාර්ය භාරය ඉටු කිරීමටත් රාජ්‍ය අංශයෙන් ලැබෙන මූල්‍යමය සම්පත් ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා රාජ්‍ය නොවන අංශවලින් ලැබෙන මූල්‍යමය සම්පත් මත රඳා පැවතීමට සිදු වී ඇති බවත් නිගමනය කළ හැකි ය.

සමාලෝචනය නම් වූ අවසාන පරිච්ඡේදයේ දී සමස්ත පර්යේෂණය තුළින් අනාවරණය වන කරුණු ගොනු කර දැක් වූ අතර ඒ තුළින් එළඹිය හැකි නිගමන ද සාරාංශ ගත කරන ලදී. මධ්‍ය මහා විද්‍යාල වඩා කාර්යක්ෂම ව පවත්වා ගෙන යෑමට තුඩු දිය හැකි යෝජනා ඉදිරිපත් කිරීම ද මෙ ම පර්යේෂණය ආශ්‍රයෙන් පසු පර්යේෂකයනට කළ හැකි ඉදිරි පර්යේෂණ පිළිබඳ ඉඟි සැපයීම ද එ ම පරිච්ඡේදයේ දී ම සිදු විය.